කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2012/13

2016 - පෙබරවාරි

**BCOM E1055 - ව්‍යාපාර හා කාර්මික නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. "සියළුම ගිවිසුම් එකඟත්වයන් වන අතර සියළු එකඟත්වයන් ගිවිසුම් නොවේ." මෙම ප්‍රකාශයෙහි වලංගු භාවය පිළිබඳ සුදුසු නිදසුන් යොදා ගනිමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ආ. අර්පනයක් කාලය අවසන් වීම මත සහ ඉල්ලා අස්කර ගැනීම මත අවසන් වන අවස්ථා විස්තර කරන්න. සුදුසු නිදසුන් සපයන්න.

(ලකුණු 12)

02. අ. කාලයිල් එ. කාබොලික් ස්මොක් බෝල් සමාගම (1893) CA නඩු තීන්දුවට අදාල වන ගිවිසුම් නීතියේ එන මූලධර්ම තුනක් නම් කොට විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. අමල් සහ බිමල් ගංගාවක ප්‍රතිවිරුද්ධ ඉවුරු වල සිටිති. අමල් ඔහුගේ බයිසිකලය රු. 10000/- බිමල් වෙත විකිණීම සඳහා කෑගසා අර්පනයක් ඉදිරිපත් කරයි. බිමල්ට අදාල අර්පණය පිළිබඳව සන්නිවේදනය වන අතර ඔහුද කෑගසා එය ප්‍රතිග්‍රහනය කරයි. අවාසනාවකට එම අවස්ථාවේදී ඒ අසලින් පියාසර කළ ගුවන්යානයක ශබ්දය හේතුවෙන් බිමල්ගේ ප්‍රතිග්‍රහනය, අමල් වෙත සන්නිවේදනය වූයේ නැත.
අමල් සහ බිමල් අතර වලංගු ගිවිසුමක් හට ගෙන තිබේද ? හේතු දක්වන්න.

(ලකුණු 14)

03. අ. " අවනිදේශනය " ස්ථාපිත කිරීම උදෙසා අවශ්‍ය වන කොන්දේසි මොනවාදැයි කෙටියෙන් දක්වන්න.

(ලකුණු 08)

ආ. " රාජා ජුවෙලර්ස් " වෙත ඇතුල් වන කුමාරි නමැත්තිය තමා සුප්‍රසිද්ධ දේශපාලඥයෙකු වන ජෝන් පෙරේරාගේ බිරිද බැව් වංචනික ලෙස ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියා වෙත ඒත්තු ගන්වන ලදී. ඇය ණය පදනම මත රු. 500,000/- පමණ වටිනා රන්මාලයක් ලබා ගන්නා ලද අතර ඒ සඳහා ඇය මුදල් ගෙවීම පැහැර හරින ලදී. මේ අතර ඇය එම මාලය ඩේවිඩ් නම් තවත් ස්වර්ණාභරණ වෙළෙන්දෙකු වෙත රු. 250,000/- මුදලකට විකුණන ලදී. රාජා ජුවලර්ස් ආයතනයට අදාල රන් මාලය ඩේවිඩ් වෙතින් නැවත ලබා ගත හැකි ද ?

(ලකුණු 12)

04. අ. මේසයක් සහ පුටු 06 ක් මිලදී ගැනීම සඳහා ගාමිණි, රන්මල් ගෘහභාණ්ඩ පුද්ගලික සමාගම සමඟ 2015 ජනවාරි 01 දින ගිවිසුමකට ඇතුලත් වෙයි. ඔහු එම භාණ්ඩ පසු දින රැගෙන යාම සඳහා විධිවිධාන යොදන ලදී. අදාල භාණ්ඩ සඳහා මුළු මුදල පෙබරවාරි 01 දින ගෙවීමටද ගාමිණි එකඟ විය. ජනවාරි 01 දින රාත්‍රි කාලයේ ඇතිවූ ගින්නක් හේතු කොට ගෙන අදාල ආයතනයේ තිබූ සියළු ගෘහභාණ්ඩ විනාශයට පත් විය. තමා මිලදී ගත් ගෘහභාණ්ඩ සඳහා ගාමිණි මුදල් ගෙවිය යුතු ද ? හේතු දක්වන්න.

(ලකුණු 12)

ආ. " භාණ්ඩ වල අයිතිකරු නොවන සහ භාණ්ඩ වල අයිතිකරුගේ බලය හෝ අනුමැතිය නොමැතිව භාණ්ඩ තොගයක් යම් තැනැත්තෙකු විසින් විකුණුව හොත් ඒවා මිලදී ගන්නා තැනැත්තාට විකුණූ තැනැත්තාට ඒ භාණ්ඩ සම්බන්ධයෙන් ඇති අයිතියට වඩා හොඳ අයිතියක් නොලැබේ යන්න සාමාන්‍ය රීතියයි." මෙම රීතියට අදාල ප්‍රධාන ව්‍යාතිරේක පෙන්වා දෙන්න.

(ලකුණු 08)

05. අ. " අපරානුමැතිය මත ඇති වන නියෝජ්‍යත්වය " යනු කුමක්ද ? වලංගු අපරානුමැතියක් උදෙසා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි මොනවා දැයි සඳහන් කරන්න.

(ලකුණු 12)

ආ. ජනක භාණ්ඩ තොගයක් විකිණීම සඳහා ගිය නියෝජිතයා ලෙස පෙරේරාව පත් කරයි. භාණ්ඩ විකිණීමේදි සෑම එක් ගණුදෙනුවකට වටිනාකම රු. 100,000/- වඩා අඩු නොවිය යුතු බවට ඔහු තවදුරටත් පෙරේරාට උපදෙස් දෙයි. පෙරේරා භාණ්ඩ තොගයක් රු. 90,000/- කට රොෂාන්ට විකුණන අතර ගිවිසුම සඳහා පෙරේරා එළඹෙන්නේ ඔහුගේ නමින්ය. එක් එක් පාර්ශවයන්හි නීතිමය තත්වය විමසන්න.

(ලකුණු 08)

06. අ. රන්, මිනි සහ මුතු වෙළඳ හවුලක, හවුල්කරුවන් වේ. රන් සිය හවුල් ව්‍යාපාරය වෙනුවෙන් පහත සඳහන් කාර්ය ඉටු කරයි.

i. හවුල් ව්‍යාපාරයේ නමින් විනිමය බිල්පතක් භාර ගැනීම

ii. රු. 500,000 /- වටිනා ගොඩනැගිල්ලක් මිලදී ගැනීම

iii. හවුල් ව්‍යාපාරයේ භාණ්ඩ උකසට තබා රු. 50,000/- ණයක් ලබා ගැනිම

iv. ව්‍යාපාරය වෙනුවෙන් පනවා තිබූ දිගුකාලයක් තිස්සේ පැවති නඩුවක් ඉල්ලා අස් කර ගැනීම

v. ව්‍යාපාරය වෙනුවෙන් සිය නමින් බැංකු ගිණුමක් ආරම්භ කිරිම.

රන් විසින් කරන ලද කාර්යය වල වලංගුභාවය පිළිබඳව කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)

ආ. " බාලවයස්කරුවෙකුට හවුල්කරුවෙකු වීමට නොහැකි වුවත් හවුල්ව්‍යාපාරයෙහි වාසි භුක්ති විඳිය හැකිය. " විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 04)

ඇ. ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර නීතියට අදාල මූලාශ්‍ර තුනක් දක්වන්න.

(ලකුණු 06)

07. අ. කාර්මික ආරවුල් නිරාකරණය පිණිස කම්කරු කොමසාරිස්වරයා විසින් හඳුන්වා දී ඇති විවිධ ක්‍රම මොනවාද ?

(ලකුණු 06)

ආ. " කාර්මික ආරවුලක් " යනු කුමක්ද ? විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් දක්වන්න.

(ලකුණු 08)

ඇ. කාර්මික අධිකරණයක සංයුතිය, බලය සහ යුතුකම් මොනවාදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

08. පහත දෑ කෙරෙහි අවධානය යොමු කරමින් 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත පිළිබඳව සටහනක් ලියන්න.

අ. " සාප්පුව " යන්නහි නිර්වචනය

ආ. වැඩ කරන කාල සීමාව

ඇ. පොදු නිවාඩු

ඉ. වාර්ෂික නිවාඩු

ඊ. අනියම් නිවාඩු

උ. පත්වීමේ ලිපිය

(ලකුණු 20)